(3)


# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.01. 27

**චක්‍රලේඛ - බැ/නි/ඒ/2021/01**

සියලුම මූල්‍ය සේවා සමුපකාර සමිති සහ

සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් විසින් රැස් කරනු ලබන තැන්පතු සහ සාමාජිකයින් සඳහා ප්‍රදානය කරන ණය සහ අත්තිකාරම් සඳහා පොළී අනුපාත සංශෝධනයන් සිදු කිරීම**

**01.** හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කඩිනම් ආර්ථික සංවර්ධනයක් සඳහා අතීතයේ පැවති දැඩි මූල්‍ය ප්‍රතිපත්ති වෙනුවට ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙමින් මෑතකදී බැංකු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2% දක්වා අඩු කිරීමටත්, ප්‍රතිපත්තිමය පොළී අනුපාත පහත දැමීමටත් කටයුතු කර ඇත.

මෙයට යහපත් ප්‍රතිචාරයක් දක්වමින් සියලුම වානිජ සහ විශේෂිත බැංකු ද, ඇතැම් මූල්‍ය සමාගම් ද සිය තැන්පතු පොළිය සහ ණය හා අත්තිකාරම් පොළිය, ණය කාඩ්පත් සඳහා අය කරන පොළිය, උකස් අත්තිකාරම් සඳහා අය කරන පොළිය සහ අනෙකුත් සාමාන්‍ය පොළී අනුපාතයන් අඩු කිරීමට කඩිනම් පියවරයන් ගෙන ඇත.

රජය විසින් ගෙන ඇති මෙම පියවරයන්ගේ ප්‍රධාන අරමුණ වන්නේ රට තුළ Covid 19 වසංගතයෙන් ආර්ථික දුෂ්කරතාවන්ට ලක් වූ ප්‍රජාවට සහන සැලසීම සඳහා සහ කෘෂිකර්ම, කර්මාන්ත සහ සේවා අංශයන්ගේ වර්ධනය ද, අපනයන කටයුතු නැංවීම ද, ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය තුළින් රැකියා නියුක්තිය වැඩි කරලීමට සහාය සැලසීමයි.

මෙම සාර්ව ආර්ථික අරමුණු කෙරෙහි ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති අංශයේ සක්‍රීය දායකත්වය ලබා දීම පිණිස ඒවායේ ණය මුදල් හා අදාල පොළී අනුපාත අඩු කිරීම සහ ඊට සාපේක්ෂව අරමුදල් පිරිවැය කළමනාකරණය පිණිස තැන්පත් පොළී අනුපාත සංශෝධනය කිරීම මෙම චක්‍රලේඛයෙන් අපේක්ෂා කෙරේ.

02. යෝජිත අඩු කරන ලද තැන්පතු පොළී අනුපාත

1. ඉතුරුම් තැන්පතු

| ඉතුරුම් තැන්පතු | වාර්ෂික පොළී අනුපාතය |
|---|---|
| සාමාන්‍ය ඉතුරුම් තැන්පතු | - 3.00% |
| ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම් තැන්පතු | - 5.00% |
| ධනයෝජන ඉතුරුම් තැන්පතු | - 5.00% |
| සන්නම් නාම සහිත කාන්තා ඉතුරුම් | - 3.50% |
| ළමා ඉතුරුම් | - 4.50% |
| සමුපකාර සමිති වල ඉතුරුම් ගිණුම් | - 4.00% |
| සමෘද්ධි ඉතුරුම් ගිණුම් | - 4.00% |

2. ස්ථාවර තැන්පතු

| ස්ථාවර තැන්පතු | වාර්ෂික පොළී අනුපාතය | මාසිකව ස්ථාවර තැන්පත් පොළී ලබා ගන්නා විට පොළී අනුපාතය |
|---|---|---|
| තෙමසකින් කල් පිරෙන | - 4.75% | 4.50% |
| හය මසකින් කල් පිරෙන | - 5.00% | 4.75% |
| වසරකින් කල් පිරෙන | - 5.25% | 5.00% |
| වසර 5කින් කල් පිරෙන | – 5.00% | 4.75% |

මාසිකව ස්ථාවර තැන්පත් පොළිය ලබා ගන්නේ නම් වාර්ෂික ස්ථාවර තැන්පතු සඳහා හිමි පොළී අනුපාතයෙන් 0.25%ක පොළී ප්‍රතිශතයක් අඩු කළ යුතු ය.

03. යෝජිත ණය සහ අත්තිකාරම් සඳහා පොළී අනුපාත

දැනට පවත්නා ණය අනුපාතය තනි ඉලක්කමකින් විය යුතු වන අතර, නව අනුපාතයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ගත යුතු ය.

- උකස් අත්තිකාරම් සඳහා ලබා ගන්නා පොළී අනුපාතය 12%
- ප්‍රමාද ගාස්තු උපරිම 2%

දැනට අය කරනු ලබන ණය පොළී අනුපාතය වසරකින් කල් පිරෙන ස්ථාවර තැන්පතුවකට ගෙවනු ලබන පොළී ප්‍රතිශතයට වඩා 4% - 6.5%ක් අතර වන සේ ගළපා ගත යුතු ය.

04. විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු

1. නව ණය නිකුතුව සඳහා පමණක් මෙම පොලී අනුපාත වෙනස් කිරීම් අදාල කර ගත යුතු අතර, මෙම චක්‍රලේඛයේ දිනට පෙර ප්‍රදානිත ණය මුදල් සඳහා එවකට පැවති පොලී අනුපාතයන් අය කර ගැනීමට කටයුතු කළ යුතු ය. එම පොලී අනුපාත අඩු කළ නොහැකි වන්නේ අදාල ණය මුදල් සඳහා සාපේක්ෂ වශයෙන් අධික පොලී අනුපාත මත ලබා ගත් තැන්පත් මත එම ණය මුදල් ප්‍රදානය කර තිබීමයි.

2. ණය පොලී අනුපාත සංශෝධනයන්හිදී එහි අවශ්‍යතාව සහ සමිතියට වන බලපෑම පැහැදිලිව විස්තර කෙරෙන සංදේශයක් ආයෝජන සහ අවදානම් කළමනාකරණ කමිටුවට (IRMC) ඉදිරිපත් කර සාකච්ඡා කිරීමෙන් පසු පමණක් යෝජිත නව අනුපාතයන් තීරණය කළ යුතු ය.

3. ණය පොලී අනුපාතයන් අඩු කිරීමේ දී ඒ පිළිබඳව ගණුදෙනුකරුට ලිඛිතව දැනුවත් කිරීම සුදුසු ය.

4. ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් විසින් රැස් කරනු ලබන තැන්පතු සහ සාමාජිකයින් සඳහා ප්‍රදානය කරන ණය සහ අත්තිකාරම් සඳහා පොලී අනුපාත සංශෝධනයන් සිදු කිරීම සඳහා මාස තුනක කාලයක් ලබා දීම සුදුසු ය.

මීට පෙර නිකුත් කරන ලද උපදෙස් පත්‍රිකා අංක බැ/නි/ඒ/2013/03 දරණ 2013/09/29 දිනැති උපදෙස් පත්‍රිකාව මින් අවලංගු කරමි.
ඔබ සමුපකාර සමිතිය/ සංගමය විසින් රැස් කරනු ලබන තැන්පතු සහ සාමාජිකයින් සඳහා ප්‍රදානය කරන ණය සහ අත්තිකාරම් සඳහා පොලී අනුපාත සංශෝධනයන් මෙම චක්‍රලේඛයේ සඳහන් නියමයන්ට අනුව කටයුතු කරන මෙන් අවධාරණය කරමි.

සුචින්ද එස්. සිංගප්පුලි,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්